# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2153/6 - 2019 දෙසැම්බර් මස 09 වැනි සඳුදා - 2019.12.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාව**

දෙවන සංශෝධනය

2019 සැප්තැම්බර් 19 දිනැති, අංක 2141/73 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් සංශෝධිත 2015 ජුලි 28 දිනැති හා අංක 1925/37 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි

එම්.ඒ.බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2019 දෙසැම්බර් මස 05 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

<table>
<tr><th>ඡේද අංකය</th><th>යෝජිත සංශෝධනය</th></tr>
<tr><td>7.2.2.1 (iv)</td><td>(iv) අදාළ විෂය ක්ෂේත්‍රයේ මූලික උපාධිය සමඟ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධියක් (වෘත්තීය විෂයයන් සඳහා ඕනෑම ක්ෂේත්‍රයක මූලික උපාධිය සමග අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.)</td></tr>
<tr><td>7.2.4</td><td>(iii) ලිඛිත විභාගයෙන් සමත් වීමට අවශ්‍ය අවම ලකුණු සංඛ්‍යාව හා ඊට ඉහළ ලකුණු ලැබූවන් අතුරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.<br><br>(iv) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වන අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට හා ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ.<br><br>(v) ලිඛිත පරීක්ෂණයෙන් හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය යටතේ වන ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය ලබා දී ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේ දී, යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී හා ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබාගත් ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සේවයට බඳවා ගනු ලැබේ.</td></tr>
<tr><td>7.2.4.3 හි (අ)</td><td>(අ) ලකුණු ලබා දෙනු නොලැබේ.</td></tr>
<tr><td></td><td>"ව්‍යුහගත පරීක්ෂණය" ලෙස සඳහන් සියලු ස්ථාන "යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය" ලෙස සංශෝධනය විය යුතුය.</td></tr>
<tr><td>7.2.4.4</td><td>යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය:<br><br>(I) යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය<br><br>අ) පහත දක්වා ඇති ක්ෂේත්‍රයන්හි මූලික සුදුසුකම්වලට අමතරව ලබා ගත් අතිරේක සුදුසුකම් සඳහා ලකුණු ලබා දේ.
<table>
<tr><th>ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ</th><th>උපරිම ලකුණු ප්‍රමාණය</th><th>අවම ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td>1. අතිරේක අධ්‍යාපන සුදුසුකම්</td><td>20</td><td rowspan="4">අදාළ නොවේ</td></tr>
<tr><td>2. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය</td><td>15</td></tr>
<tr><td>3. තොරතුරු සන්නිවේදන තාක්ෂණ කුසලතාවය</td><td>15</td></tr>
<tr><td>එකතුව</td><td>50</td></tr>
</table>
සටහන<br><br>(i) ඉහත වගුවෙහි 1 කොටසෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටියක් අනුමත කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ඇත.</td></tr>
</table>

<table>
<tr><th>ඡේද අංකය</th><th>යෝජිත සංශෝධනය</th></tr>
<tr><td></td><td>(ii) ප්‍රායෝගික පරීක්ෂණය<br><br>අ) විෂයයට අදාළව දෙනු ලබන මාතෘකාවක් ඔස්සේ කරනු ලබන ඉදිරිපත් කිරීමක් සඳහා පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයක් වේ.
<table>
<tr><th>ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ</th><th>උපරිම ලකුණු ප්‍රමාණය</th><th>අවම ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td>1. පිවිසුම</td><td>05</td><td rowspan="6">20</td></tr>
<tr><td>2. විෂයය අන්තර්ගතය</td><td>20</td></tr>
<tr><td>3. ඉදිරිපත් කිරීමේ විලාශය</td><td>10</td></tr>
<tr><td>4. කාල කළමනාකරණය</td><td>10</td></tr>
<tr><td>5. සාරාංශ ගත කිරීම</td><td>05</td></tr>
<tr><td>එකතුව</td><td>50</td></tr>
</table>
</td></tr>
<tr><td>7.3.2.1(v)</td><td>(v) අදාළ විෂය ක්ෂේත්‍රයේ මූලික උපාධිය සමඟ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධියක් (වෘත්තීය විෂයයන් සඳහා ඕනෑම ක්ෂේත්‍රයක මූලික උපාධිය සමග අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.)</td></tr>
<tr><td>7.3.2.1 යටතේ ඇතුළත් සංලක්ෂ්‍යය 01</td><td>සේවා ව්‍යවස්ථාවේ උපලේඛන VII හි දක්වා ඇති මෙම අවම සුදුසුකම් යටතේ බඳවා ගනු ලබන නිලධාරීන් බඳවා ගත් දින සිට වසර 05ක් තුළ තමා බඳවා ගත් විෂයයට අදාළව සේවා ව්‍යවස්ථාවේ සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ගැනීමට අපොහොසත් වන නිලධාරීන්ගේ වැටුප් වර්ධක ලබා දීම සුදුසුකම් සම්පූර්ණ කරන තුරු නතර කළ යුතු ය. එම නිලධාරීන්ගේ II ශ්‍රේණියේ අදාළ උසස්වීම සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා ගනු ලබන අමතර කාල සීමාවට සමාන කාලයකින් ප්‍රමාද කරනු ලැබේ.</td></tr>
<tr><td>7.3.4</td><td>(iii) ලිඛිත විභාගයෙන් සමත් වීමට අවශ්‍ය අවම ලකුණු සංඛ්‍යාව හා ඊට ඉහළ ලකුණු ලැබූවන් අතුරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.<br><br>(iv) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වන අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට හා ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ.<br><br>(v) ලිඛිත පරීක්ෂණයෙන් හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය යටතේ වන ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය ලබා ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේ දී, යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී හා ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබාගත් ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සේවයට බඳවා ගනු ලැබේ.</td></tr>
<tr><td>7.3.4.3 හි (අ)</td><td>(අ) ලකුණු ලබා දෙනු නොලැබේ<br><br>ලෙස සංශෝධනය කරන්න.</td></tr>
</table>

| *ඡේද අංකය* | *යෝජිත සංශෝධනය* |
|---|---|
| 7.3.4.4 | යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණයඃ<br><br>ලෙස මාතෘකාව සංශෝධනය කරන්න. |
| 10.1<br>10.1.1 | III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම<br><br>සපුරාලිය යුතු සුදුසුකම් ඃ<br><br>(viii) ධාරිතා සංවර්ධන පාඨමාලා 01 සාර්ථකව සම්පූර්ණ කර තිබීම. (උප ලේඛන XI) ලෙස සංශෝධනය කරනු ලැබේ. |
| 10.2.1 (i) හි (ඇ) | (ඇ) ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට බඳවා ගැනීමේ දී අදාළ විෂයය ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධිය මූලික සුදුසුකමක් වූ නිලධාරීන් සඳහා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| 15.1 | මේ යටතේ සඳහන් සියලු කරුණු ඉවත් කර පහත සඳහන් කරුණු ඇතුළත් කරනු ලැබේ.<br>අන්තර්කාලය තුළදී III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.<br><br>(අ) 8හි සංලක්ෂය 02 අදාළ වේ.<br><br>(ආ) අංක 1070/13 හා 1999.03.11 දිනැති සේවා ව්‍යවස්ථාවේ 14 වගන්තියෙහි (අ) හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සඳහා 10.1.1 (II) හා (III) වගන්ති පහත පරිදි සංශෝධනය වන අතර (VIII)හි සඳහන් සුදුසුකම් හැර අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනයේ සිට උසස් කරනු ලැබේ.<br><br>* උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වසර හතක (07)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හත (07)ක් උපයාගෙන තිබීම.<br><br>* අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්කිරීමේ දිනය පෙරාතුව වූ වසර හත (07)ක් තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.<br><br>(ඇ) අංක 1070/13 හා 1999.03.11 දිනැති සේවා ව්‍යවස්ථාවේ සඳහන් 17 වගන්තිය අනුව ඉංග්‍රීසි සමත්වීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කර නොමැති 2002.01.01 දිනට පෙර ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට බඳවා ඇති නිලධාරීන් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා විසින් තීරණය කරනු ලබන ආයතනයකින් පවත්වනු ලබන සති 02කට නොඅඩු ඉංග්‍රීසි පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කළ යුතුය. එම නිලධාරීන්ගේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) ඉංග්‍රීසි විෂය සමත් වී ඇති නිලධාරීන් මෙම සුදුසුකම සම්පූර්ණ කර ඇති නිලධාරීන් ලෙස සලකනු ලැබේ. |
| 15.2 | මේ යටතේ අංක 2141/73 දරන 2019.09.19 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පළ කරන ලද සංශෝධන යටතේ සඳහන් කරුණු ඉවත් වන අතර, අංක 1925/37 දරන 2015.07.28 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අනුමත සේවා ව්‍යවස්ථාවෙහි සඳහන් කරුණු අදාළ වේ. |
| උපලේඛන III<br>1.4 English Language | Communication Skills<br><br>ලෙස සංශෝධනය කරන්න |

12 - 802

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.